# කෙටි ප්‍රශ්න

1. මාර දූවරු තිදෙනා නම් කරන්න.
2. සිදුහත් කුමරුට සාදා දුන් මාළිගා 3 නම් කරන්න.
3. පංච මහා විලෝකය නම් කරන්න.
4. සතර පෙර නිමිති නම් කරන්න.
5. නිබ්බුත පද දක්වා එහි තේරුම ලියන්න.
6. යශෝදරා දේවිය හඳුන්වන තවත් නමක් ලියන්න.
7. යශෝදරා දේවියගේ පියා නම් කරන්න.
8. සිදුහත් කුමරුගේ සහ යශෝදරා දේවියගේ කුල වංශ නම් කරන්න.
9. යශෝදරා දේවියට පුතකු උපන් බව දැනගත් මොහොතේ සිදුහත් කුමරුගේ මුවින් පිටවූ වදන ලියන්න.
10. දස මාර සේනාව නම් කරන්න.
11. තෙරුවන් නම් කරන්න.
12. තෙරුවන් ගුණ සංඛ්‍යාත්මකව දක්වන්න.
    1. බුදු ගුණ කීයද ?
    2. දහම් ගුණ කීයද ?
    3. සඟ ගුණ කීයද ?
13. බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනාව පැවැත්වූයේ කොහෙදීද ? කාටද ?
14. ධර්මධර, විනය ධර භික්ෂු කලහය ඇතිවූයේ කුමන ස්ථානයේදී ද ?
15. ධර්මධර විනය ධර භික්ෂූන් වහන්සේ අතර ඇති වූ ගැටළුව සමථයකට පත් නොවූ නිසා බුදු හිමියන් වැඩම කළේ කුමන වනයට ද?
16. සිව්පසය නම් කරන්න.
17. පංච බුද්ධ කෘත්‍ය හෙවත් බුදුන් වහන්සේගේ දින චරියාව නම් කරන්න.
18. බුදුරජාණන් වහන්සේගේ නිබද්ධ චාරිකාව හඳුන්වන්න.
19. අටලෝදහම නම් කරන්න. ගාථාවද ලියන්න.
20. අසදෘස මහා දානය දුන්නේ කව්රුන්ද ?
21. තුන් බෑ ජටිලයන් නම් කරන්න.
22. තෙවැදෑරුම් වීර්ය නම් කරන්න.
23. මහා කපි, මඝ මානවක යන ජාතක කතා තුළින් හෙළිවන්නේ කුමන පාරමිතාවක් ගැන ද?
24. මෛත්‍රී කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 5 ක් දක්වන්න.
25. දූරංගමං ඒකචරං ගාථාව සම්පූර්ණ කරන්න.
26. එහි තේරුම ලියන්න.
27. බෞද්ධයාගේ පරම අපේක්ෂාව කුමක් ද?
28. ප්‍රබුද්ධ ජීවිතය යනු කුමක් ද?

29. සිත දුබල කරන කෙලෙස් නම් කරන්න.

30. කුසල යන්නෙහි පළමු, දෙවන, තෙවන අදහස් නම් කරන්න.

31. පංච ඉන්ද්‍රිය නම් කර ඒවාට ගෝචර වන බාහිර අරමුණු වගුවෙහි දක්වන්න.

| පංච ඉන්ද්‍රිය | අරමුණු |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

32. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව ණය ගැතියෙකු ණය හිමිට යම් බැඳීමක් ඇති ද එවිට වහලෙකු මෙන් යටත් වන බව පෙන්වා දී ඇති නීවරණ ධර්මය කුමක් ද?

33. ව්‍යාපාදය යන්න අර්ථ දක්වන්න.

34. ව්‍යාපාදය දුරු කළ හැක්කේ කෙසේද ?

35. ථීනමිද්ධ යන්න අර්ථ දක්වන්න.

36. ථීනමිද්ධ දුරු කිරීමට අනුගමනය කළ හැකි දෙවැදෑරුම් කරුණු මොනවාද ?

37. ථීනමිද්ධ දුරු කිරීමට යොදා ගත හැකි පංච විධ වීර්යයන් තුනක් නම් කරන්න.

38. උද්ධච්ච කුක්කුච්ච යන්න අර්ථ දක්වන්න.

39. උද්ධච්ච කුක්කුච්ච නීවරණය යටපත් කළ හැක්කේ කෙසේද ?

40. විචිකිච්ඡා නීවරණය අර්ථ දක්වන්න.

41. විචිකිච්ඡා නීවරණය දුරු කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග දක්වන්න.

42. සාමඤ්ඤඵල සූත්‍රයේ විචිකිච්ඡාව හඳුන්වා ඇත්තේ කෙසේ ද?

43. නීවරණ ධර්ම යටපත් කිරීමෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ප්‍රයෝජන තුනක් නම් කරන්න.

44. විදර්ශනා භාවනාවේ ''ජීවිතය'' විග්‍රහ කර ඇත්තේ කෙසේද ?

45. භාවනා වර්ග 2 නම් කරන්න.

46. ''චිත්ත' සමේතීති සමථෝ'' යන්නෙහි තේරුම ලියන්න.

47. ''කාය වාචාය සමෝදානං සීලං'' අර්ථය ලියන්න.

48. කර්මස්ථාන දෙන ගුරුවරයා හඳුන්වන්නේ කුමන නමකින්ද ?

49. විදර්ශනාව යන්න හඳුන්වන්න.

50. ත්‍රි ලක්ෂණය නම් කරන්න.

51. වැලිවිට සරණංකර හිමි වැඩ සිටි යුගය හා කාලය දක්වන්න.

52. වැලිවිට සරණංකර හිමි වැඩසිටි ගම් ප්‍රදේශය හා වැලිවිට හිමියන්ගේ ගිහිකල නම කුමක් ද?

53. වැලිවිට සරණංකර හිමියන් පැවිදි වූයේ අවුරුදු කීයේ දීද ? කොහේදීද ?

54. උන්වහන්සේට ''පිණ්ඩපාතික අසරණ සරණ'' යන ගෞරව නාමය ලැබුණේ කෙසේද ?

55. සරණංකර හිමියන් පිහිට වූ සංවිධානය නම් කරන්න.
56. පිරිහී තිබූ උපසම්පදා විනය කර්ම නැවත පිහිට වුයේ කුමන රජ දවසේ ද?
57. උපසම්පදා විනය කර්මය නගා සිටුවීමට සියම් රටෙන් වැඩම වූ සියම් භික්ෂූන් වහන්සේගේ නම කුමක් ද?
58. මෙම හිමියන්ගේ නිහතමානී ගුණය පෙන් වීමට සිය භූමියේ පිවිසුම් දොරටුවේ සඳහන් කර ඇති පාඨය කුමක් ද?
59. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සරණංකර හිමියන්ට පුද කල තනතුර කුමක් ද?
60. සරණංකර සංඝරාජයාණන් වහන්සේ අපවත් වූ වර්ෂය කුමක් ද?
61. දුටුගැමුණු රජතුමාගේ මව්පියන් කවුරුන්ද ?
62. දුටුගැමුණු රජතුමාගේ සොහොයුරාගේ නම කුමක් ද?
63. එළාර රජුට පෙර මෙරට පාලනය කර ඇති දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් කවුද ?
64. රේරුකානේ චන්ද විමල නාහිමියන්ගේ උපන් දිනය හා ගිහි නම සඳහන් කරන්න.
65. රේරුකානේ චන්දවිමල නාහිමියන් සමඟ පැවිදි දිවියට එළඹි පිරිස කීදෙනෙක්ද ?
66. රේරුකානේ චන්දවිමල හිමියන් පැවිදි වූයේ කවදා ද ?
67. රේරුකානේ චන්දවිමල හිමිපාණෝ බුරුම දේශයේ අධ්‍යාපනය ලැබූ කාලය සඳහන් කරන්න.
68. ධර්මපාලතුමාගේ සහෝදර සහෝදරියන් කී දෙනාද ?
69. අනගාරික ධර්මපාලතුමා බුද්ධගයාව බේරා ගැනීමට පෙර එම භූමිය අත්පත් කරගෙන සිටි පූජකයා නම් කරන්න.
70. අනගාරික ධර්මපාලතුමා පැවිදි වූ වර්ෂය කුමක් ද?
71. සිරි දේවමිත්ත ධර්මපාල හිමිනම උපසම්පදා වූ වර්ෂය කුමක් ද?
72. සිරි දේවමිත්ත ධර්මපාල හිමියන් අපවත් වූ වර්ෂය කුමක් ද?
73. ධම්මපදයේ වග්ග කීයද ? ගාථා කීයද? නිදාන කථා කීයද ?
74. සිල් රැකීමේ ආනිසංස කීයද ?
75. කෙනෙකුගේ ධනය විනාශ වන ක්‍රම 6 නම් කරන්න.
76. ධනය විනාශ වන ක්‍රම දැක්වෙන සූත්‍ර දේශනාව කුමක් ද?
77. සියලු සුවඳ වර්ග අතරින් උතුම්ම සුවඳ ලෙස බුදුරජාණන් වහන්සේ හැඳින්වූයේ කුමක් ද?
78. කුසල කර්ම හා අකුසල කර්ම කරන තැනැත්තා මරණින් මතු උපත ලබන්නේ කොහේද ?
79. යෝ චේ වස්සසතං ජීවේ..... ගාථාව අයත් වන්නේ ධම්මපදයේ කුමන වග්ගයටද ?
80. සිගාලෝවාද සූත්‍රයේ සමාජය කොටස් කීයකට බෙදා දක්වා තිබේද ?
81. සිගාල සිටු පුත්‍රයා නමස්කාරය කළේ කාටද ?
82. පුද්ගලයාගේ මෙලොව දියුණුව ප්‍රමුඛ ස්ථානයෙහි තබමින් පරලොව දියුණුව පිළිබඳවද ධර්ම කරුණු විග්‍රහ කොට ඇති සූත්‍ර දේශනා තුන නම් කරන්න.
83. බුදුදහම ස්වාක්ඛාත දහමක් ලෙස හැඳින්වෙන්නේ ඇයි ?
84. බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රය දේශනා කළේ කාහටද ? කොහේදීද ?

85. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව මිනිසාගේ මෙලොව හිත සුව පිණිස දේශනා කරන ලද කරුණු 4 නම් කරන්න.

86. උට්ඨාන සම්පදා යන්න අර්ථ දක්වන්න.

87. ධාර්මික රැකියා අංශ 6 නම් කරන්න.

88. ආරක්ඛ සම්පදා යන්න අර්ථ දක්වන්න.

89. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව ධනය විනාශ වී යා හැකි ක්‍රම 4ක් නම් කරන්න.

90. කල්‍යාණ මිත්‍රයෙකු තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු විශේෂ ලක්ෂණය කුමක් ද?

91. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීම තුළින් පුද්ගලයෙකුගේ ජීවිතයට ළඟා කරගත හැකි ගුණධර්ම 4 ක් නම් කරන්න.

92. ඔබේ මිතුරා ලෙස පාප මිත්‍රයෙක් වෙනුවට කල්‍යාණ මිත්‍රයෙක් තෝරා ගැන්මෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 4ක් සඳහන් කරන්න.

93. තමාගේ ආදායමට සරිලන පරිදි වියදම් කිරීම බුදු දහමේ හඳුන්වන්නේ කුමන නමකින් ද?

94. අඩු ආදායමක් ඇති වැඩියෙන් වියදම් කරන්නා බුදු දහමින් උපමා කර ඇත්තේ කුමකට ද?

95. මහා මංගල සූත්‍රයේ පුද්ගලයාගේ දියුණුවට අදාළ කරුණු කීයක් දක්වා තිබේද ?

96. මංගල සූත්‍රයේ සඳහන් මෙලොව දියුණුවට ඉවහල් වන කරුණු 5ක් ලියන්න.

97. මංගල සූත්‍රය ඇසුරින් පරලොව දියුණුවට ඉවහල් වන කරුණු 3 ක් ලියන්න.

98. මංගල සූත්‍රයට අනුව පුද්ගල පෞරුෂයට වර්ධනයට බෙහෙවින් ම බලපාන කරුණු දෙක ලියා දක්වන්න.

99. පුද්ගලයා පිරිහීමට හේතුවන කරුණු දේශනා කළ යුතු සූත්‍ර දේශනාව කුමක් ද?

100. පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු 5 ක් නම් කරන්න.

101. ත්‍රිවිධ චෛත්‍යය නම් කරන්න.

102. ත්‍රිවිධ චෛත්‍යය මුල් කරගෙන බිහිවූ වෙනත් කලා නිර්මාණ මොනවා ද?

103. දුමින්දාගමනය සමඟ මෙරටට පැමිණි කලා ශිල්පීන් අයත් වූ කුල ගණන කීයද ?

104. ත්‍රිවිධ චෛත්‍යය අතරින් පළමුව වන්දනා කරන්නේ කුමන චෛත්‍යයට ද?

105. ලක්දිව බුදු සමය ස්ථාපිත වීමක් සමඟම ගොඩ නැගුන මුල්ම ස්ථූපය කුමක් ද?

106. එම දාගැබ කරවූයේ කවුරුන් විසින් ද?

107. එහි තැන්පත් කොට ඇත්තේ කුමන ධාතුන් වහන්සේ ද?

108. ස්තූපය වර්ග කර ඇත්තේ එහි කුමන අංගයක් පදනම් කරගෙනද ?

109. චතුරස්‍රාකාර ස්තූපයකට උදාහරණයක් දෙන්න.

110. ''චේතියඝරය'' වෙනත් නමකින් හඳුන්වන්න.

111. බෝධිඝරය යනු කුමක් ද?

112. ශ්‍රී ලංකාවේ සඳකඩපහණේ ප්‍රධාන යුග 3 ලියන්න.

113. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය අනුව සඳකඩපහණින් අර්ථවත් වන්නේ කුමක් ද?

114. පොළොන්නරු යුගයේ පැරණිම සිතුවම් දැකගත හැකි ස්ථාන 03 ක් නම් කරන්න.

115. පොළොන්නරු යුගයේ විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙන්නේ කුමන ස්ථානයේද ?

116. මහින්දාගමනය සිදුවන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර කීයකට පසුවද ?

117. මහින්දාගමනයෙන් සිදු වූයේ දෙවන පැතිස් රජුගේ රාජ්‍ය වර්ෂයෙන් කීවන වසරේදීද ?

118. ධර්මාශෝක රජුගේ රාජ්‍ය වර්ෂයෙන් කීවන වර්ෂයේ මහින්දාගමනය සිදුවූයේද?

119. මිහිඳු හිමියන් මෙරටට වැඩම කරන විට මෙහි සිටි පාලකයා කවුද ?

120. මෙරට බුදු දහම ස්ථාපිත වූයේ  කාගේ පැවිද්දෙන් පසුවද ?

121. දුමින්දාගමනය යනු කුමක් ද?

122. මෙරට පළමුව පැවිදි වූ ලාංකික කාන්තාව නම් කරන්න.

123. බෞද්ධ පුද සිරිත් සම්බන්ධව තොරතුරු ඇතුලත් පසු කාලීනව ලියවුණු ග්‍රන්ථය නම් කරන්න.

124. සිංහල සාහිත්‍යය යුග නම් කරන්න.

125. ගුත්තිල කාව්‍යය රචනා කරන ලද්දේ කුමන යුගයේදීද ?

126. සිංහල බෞද්ධ සාහිත්‍යය පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ කුමන ග්‍රන්ථවලද ?

127. මෙරට  පැරණිම සිංහල බෞද්ධ කෘති වශයෙන් සැලකෙන්නේ කුමන ග්‍රන්ථද ?

128. සාහිත්‍යකරණයට යොමුවන අයට උපදෙස් ලබා දී ඇති පැරණිම කෘතිය කුමක් ද?

129. අනුරාධපුර යුගේ රචනා වූ සාහිත්‍ය කෘතිවලින් අදට ශේෂව ඇති භික්ෂු පරිශීලනයට සුදුසු කෘති දෙකක් ලියන්න.

130. ධම්මපදයේ එන බුද්ධ දේශනාවනට විවරණ සැපයීමට රචනා වූ ග්‍රන්ථය කුමක් ද?

131. අනුරාධපුර යුගයේ පැරණිම සිංහල පද්‍ය නිර්මාණ හමුවන්නේ කුමන ස්ථානයෙන්ද ?

132. මහාචාර්ය සෙනරත් පරණවිතානෙ මහතා එයින් පද්‍ය කීයක් ප්‍රසිද්ධියට පත්කර ඇති ද?

133. සීගිරි ගී අධ්‍යයනය කිරීමෙන් එදා සමාජය පිළිබඳ කිනම් අවබෝධයක් ලබා ගත හැකිද?

134. පූජාවලිය රචනා කළේ කාගේ ආරාධනාවෙන් ද?

135. පූජාවලියේ පරිච්ඡේද කීයද ?

136. තිසරණ පොත් පෙළ නම් කරන්න.

137. කව්සිළුමිණ කුමන කාව්‍ය සම්ප්‍රදායට අයත් ද?

138. කව්සිළුමිණ පද්‍ය කෘතියට පාදක වූ ජාතක කථාව කුමක් ද?

139. කව්සිළුමිණ කෘතියේ සර්ග ප්‍රමාණය සහ ගී ප්‍රමාණය ලියා දක්වන්න.

140. පන්සිය පනස් ජාතක පොතේ අඩංගු කතා වස්තු ප්‍රමාණය කොපමණද ?

141. සිංහල බෝධිවංශ රචනා කිරීමට වස්තු විෂය වූයේ කුමක් ද?

142. මුල්ම සන්දේශ කෘතිය කුමක් ද? එය රචනා වූයේ කුමන යුගයේදීද?

143. එම සන්දේශය රචනා වූයේ  කිනම් රජ දවසකද ?

144. මෙම සන්දේශය රැගෙන යාමේ ගමන් මාර්ගය කුමක් ද?

145. මෙම යුගයේ ලියැවුණු වෙනත් කෘති 3 ක් ලියන්න.

146. සිංහල පද්‍යය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කුමක් ද?

147. හිඳි පිළිම සඳහා උදාහරණ දෙකක් දක්වන්න.

148. සැතපෙන පිළිමවලට උදාහරණ දක්වන්න.

149. සක්මන් ඉරියව්වට භාවිත වන වෙනත් නමක් ලියන්න.

150. ඒ සඳහා එක් උදාහරණයක් සපයන්න.

151. බුද්ධ ප්‍රතිමා කලාවේ මුද්‍රා යනුවෙන් හඳුන්වන්නේ මොනවාද?

152. ප්‍රධාන මුද්‍රා කීයද ? නම් කරන්න.

153. ත්‍රිවිධ රත්නය නම් කරන්න.

154. ශ්‍රද්ධාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

155. ත්‍රිවිද්‍යා නම් කරන්න.

156. චතුර්විධ ධ්‍යාන නම් කරන්න.

157. ප්‍රඥාව ළඟා කරගන්නා තැනැත්තා නිවා දමන කෙලෙස් ගිනි තුන නම් කරන්න.

The National e-learning Portal for The General Education